කතිරයේ බලය
புள்ளடியின் பலம்
ISSN-2706-0047
වෙළුම 6 කලාපය 3 මැතිවරණ කොමිෂන් සභාව ඔක්තෝම්බර්-දෙසැම්බර් 2022


# මැතිවරණ වියදම් පාලනය සඳහා විධිවිධාන සලසාලන නීති සම්පාදනය කිරීම.





චන්න පී ද සිල්වා
අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රමසම්පාදන)


**පසුබිම**

සර්වජන ඡන්ද බලය යනු ශ්‍රී ලාංකික පුරවැසියන් සතුව පවතින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති පරමාධිපත්‍ය බලයේ මූලිකාංගයකි. ඡන්ද බලය නිසි ලෙස ක්‍රියාත්මක කළ හැකි වනුයේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත් වේ නම් පමණි. ඕනෑම ඡන්ද විමසීමක් නිදහස් හා සාධාරණ වන්නේ ජනතාවගේ මනාපය අනිසි බලපෑම්වලින් තොරව ක්‍රියාත්මක වීමෙනි. යම් ඡන්ද විමසීමක දී කිසියම් අපේක්ෂකයකු හෝ පක්ෂයක් හෝ කණ්ඩායමක් ජනතාවගේ කැමැත්ත හෙවත් ඡන්දය ලබාගනු පිණිස කිසිදු පාලනයකින් තොරව අධික ලෙස මුදල් වැය කිරීම, ආධාර ලබාදීම, ත්‍යාග/ ප්‍රදාන ලබාදීම ආදිය සිදුකරන්නේ නම් එමගින් ජනතා කැමැත්ත කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිවීම ස්වාභාවිකය.

එබැවින්, ඡන්ද විමසීම්වල දී තරග වදින දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් නැතහොත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් දරනු ලබන වියදම් පාලනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ශ්‍රී ලංකාව තුළ මෙන්ම ලොව වෙනත් රටවල ද බෙහෙවින් සාකච්ඡාවට බඳුන් වී ඇති මාතෘකාවකි. ඉන්දියාව ඇතුළු රටවල් බොහොමයක ජන මතය නිසි ලෙස ප්‍රකාශ වීම සහතික කරගනු පිණිස මැතිවරණ වියදම් පාලනය කිරීමේ නීති රීති පනවා තිබේ. වර්තමාන ඡන්ද විමසීම්වල දී නිරන්තරයෙන්ම විද්‍යමාන වන නීති විරෝධී ක්‍රියා, ප්‍රචණ්ඩ ක්‍රියා සහ දූෂණ ක්‍රියා අවම කිරීමට ද මැතිවරණ වියදම් පාලනය සඳහා හෝ නියාමනය කිරීම සඳහා නීති රීති පැනවීමේ අවශ්‍යතාව දැඩිව මතුව තිබේ.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමයට සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීමට පෙර එනම්, 1977ට පෙර පැවති පාර්ලිමේන්තු මැතිවරණවල දී මෙන්ම වෙනත් ඡන්ද විමසීම්වල දී අපේක්ෂකයන් විසින් දරනු ලබන වියදම් පිළිබඳ වාර්තා ලබා ගැනීම හා වියදම් සීමා පැනවීම සම්බන්ධව නීති රීති ක්‍රියාත්මක විණි. එහෙත් වත්මන් නීති පද්ධතියෙහි එවන් විධිවිධාන සලසා දී නොමැත.

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා වන වාතාවරණය සාක්ෂාත් කරනු පිණිස මැතිවරණ වියදම් පාලනය සම්බන්ධව එවකට පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව හා මැතිවරණ කොමිෂන් සභාව විසින් 2013, 2014 හා 2015 වර්ෂවල දී දේශපාලන පක්ෂ ලේකම්වරුන්, දේශපාලන පක්ෂවල නියෝජිතයන් හා නීතිවේදීන් සමග සාකච්ඡා පවත්වා ඇති අතර, 2015 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද පළමු මැතිවරණ කොමිෂන් සභාව ද පක්ෂ නියෝජිතයන්, ලේකම්වරුන් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා සිවිල් ක්‍රියාකාරීන් සමග මේ පිළිබඳව සාකච්ඡා කොට එම සාකච්ඡාවල දී අදාළ පාර්ශ්ව සමඟ මූලික එකඟතා ද ඇති කර ගෙන තිබේ. එසේම මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා සිවිල් ක්‍රියාකාරීන් විසින් ජනමාධ්‍ය මගින් හා පොදු සාකච්ඡා සම්මන්ත්‍රණවල දී ද මැතිවරණ වියදම් නියාමනය පිළිබඳව ඇති වැදගත්කම අවධාරණය කොට ඇත.

එබැවින් නිදහස් සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීමට හැකිවන පරිදි ඡන්ද විමසීම්වල දී ඒ ඒ අපේක්ෂකයන්, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් දරනු ලබන මැතිවරණ වියදම් පිළිබඳව වාර්තා ලබාගැනීම සහ එකී වියදම් සඳහා සීමා පැනවීම සඳහා නීති සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය බව මැතිවරණ කොමිෂන් සභාව මෙන්ම මැතිවරණ හා සබැඳි සියළු පාර්ශ්වවල අපේක්ෂාව ද වී ඇත.

මැතිවරණ කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කරන ලද මෙම පනත් කෙටුම්පත "මැතිවරණ වියදම් පාලනය සඳහා විධිවිධාන සලසාලන නීති සම්පාදනය කිරීම මැයෙන්" 2017.09.29 දින පළමු වරට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබාදෙන ලද උපදෙස් පරිදි පනත කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත හා නිර්දේශ සඳහා ගරු නීතිපතිතුමා වෙත ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ගරු නීතිපතිතුමාගේ හා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත කෙටුම්පත් කරන ලදී. ඒ අතරතුර

සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධන මත නැවතත් 2021.11.16 දින හා ගරු නීතිපති නිශ්කාෂණ වාර්තාව සමඟ නැවත 2022.11.04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලදුව ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව 2022.12.08 දින ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

### මැතිවරණ වියදම් නියාමන පනත් කෙටුම්පතේ මූලිකාංග

මෙම පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත; 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත; 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකම හෝ මැතිවරණයකම අපේක්ෂකයන් විසින් දරනු ලබන වියදම් නියාමනය කිරීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි. ඒ අනුව,


- සෑම ඡන්ද විමසීමක් හෝ මැතිවරණයක් වෙනුවෙන් තරග වදින අපේක්ෂකයන් සඳහා අදාළ වන පරිදි ඡන්ද විමසීම් හෝ මැතිවරණ බල ප්‍රදේශයේ ලියාපදිංචි මුළු ඡන්දදායක සංඛ්‍යාවෙන් ගුණ කිරීමෙන් ලැබෙන අවසර ලත් මුදලක් මැතිවරණ කොමිෂන් සභාව හා තරග කරනු ලබන දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයන් සමඟ තීරණය කිරීම;
- එකී අවසරලත් මුදල ගැසට් පත්‍රයේ පළ කිරීම;
- යම් නිශ්චිත නීතියක් යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී තරග වදින අපේක්ෂකයන් විසින් එකී අවසරලත් මුදල ඉක්මවා වියදම් නොදැරීම;
- එම අවසරලත් මුදල ඉක්මවා යම් තරග කරනු ලබන අපේක්ෂකයකු වියදම් කරන්නේ නම් එය ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් වන අතර ඒ සම්බන්ධයෙන් පනවනු ලබන දණ්ඩනයකට ඔහු යටත්විය යුතු බව;
- ඇතැම් පරිත්‍යාග පිළිගැනීම තහනම් බව;
- අපේක්ෂකයා විසින් භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව සහ දරන ලද වියදම්වල වාර්තා හා ප්‍රකාශන තේරීම්භාර නිලධාරී හෝ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදිය යුතු බව;
- අපේක්ෂකයන් විසින් භාරදෙනු ලැබූ එකී වියදම් වාර්තා හා ප්‍රකාශන ලැබුණ බවට හා ඒවා ඕනෑම අයෙකුට පරීක්ෂා කර බැලීමට හා නියමිත මුදලක් ගෙවීමෙන් පිටපත් ලබාගත හැකි බවට දැන්වීම් මගින් ප්‍රසිද්ධ කිරීම;
- සිදු කරනු ලබන නීති විරෝධී කාර්ය පිළිබඳ වරදක් මත දණ්ඩනයකට යටත්විය යුතු බව; දැක් වේ.

## මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව හා එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව

| මැතිවරණ කොට්ඨාසය හා පරිපාලන දිස්ත්‍රික්කය | | 2022 ඡන්දහිමි නාමලේඛනය හා 2022(1) හා 2022(2) පරිපූරක නාමලේඛන අනුව ඡන්ද හිමියන් සංඛ්‍යාව | 2022 ඡන්දහිමි නාමලේඛනයට අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| කොළඹ | | 1,749,899 | 19 |
| ගම්පහ | | 1,833,604 | 18 |
| කළුතර | | 999,244 | 10 |
| මහනුවර | | 1,168,697 | 12 |
| මාතලේ | | 421,855 | 5 |
| නුවරඑළිය | | 592,482 | 8 |
| ගාල්ල | | 890,486 | 9 |
| මාතර | | 677,405 | 7 |
| හම්බන්තොට | | 510,871 | 7 |
| යාපනය | | 584,881 | 7 |
| යාපනය දිස්ත්‍රික්කය | 486,423 | | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 98,458 | | |
| වන්නි | | 300,747 | 6 |
| වවුනියාව දිස්ත්‍රික්කය | 126,915 | | |
| මන්නාරම දිස්ත්‍රික්කය | 89,794 | | |
| මුලතිව් දිස්ත්‍රික්කය | 84,038 | | |
| මඩකලපුව | | 438,108 | 5 |
| දිගාමඩුල්ල | | 539,204 | 7 |
| ත්‍රිකුණාමලය | | 303,775 | 4 |
| කුරුණෑගල | | 1,395,880 | 15 |
| පුත්තලම | | 646,547 | 8 |
| අනුරාධපුර | | 723,580 | 9 |
| පොළොන්නරුව | | 344,906 | 5 |
| බදුල්ල | | 689,786 | 9 |
| මොණරාගල | | 387,916 | 6 |
| රත්නපුර | | 911,381 | 11 |
| කෑගල්ල | | 700,087 | 9 |
| **මුළු එකතුව** | | **16,811,341** | **196** |

# මැතිවරණ නීති සංශෝධන සමාජගත කිරීම


**චින්තක කුලරත්න**
*අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති විමර්ශන හා සැලසුම්)*



මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳව පත් කළ පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කඩිනමින් නීතිගත කිරීම සඳහා අවශ්‍ය සමාජ පසුබිම සකස් කිරීම හා ඒ පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව, ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ හා මැතිවරණ අධ්‍යයන ආයතනය (IRES) සහ මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර ආයතනය (IFES) ආයතනවල අනුග්‍රාහකත්වය ඇතිව දිවයිනේ කොළඹ දිස්ත්‍රික්කය හැර සෑම දිස්ත්‍රික්කයකම සම්මන්ත්‍රණ පවත්වන ලදී. ඒ අනුව මේ දක්වා පවත්වා ඇති වැඩසටහන්වල තොරතුරු මතු දැක්වේ. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සමාජිකයන් ද මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරීන් ද දිස්ත්‍රික් ලේකම්වරු, නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරු මෙම වැඩමුළු සඳහා සම්පත්දායකත්වය ලබා දී තිබේ. ලබන වර්ෂයේ ජනවාරි මාසයේ දී කොළඹ දිස්ත්‍රික්කය ද ආවරණය වන පරිදි සියළුම පාර්ශ්වවල සහභාගීත්වයෙන් ජාතික මට්ටමේ වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කොට ඇත.

| වැඩමුළුව පැවැත් වූ දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|---|
| 2022.08.22 | හම්බන්තොට | Jade Green Hotel |
| 2022.09.08 | ත්‍රිකුණාමලය | J Kab Park Hotel |
| 2022.09.09 | පොළොන්නරුව | Deer Park Hotel |
| 2022.09.14 | කළුතර | Garden Beach Hotel |
| 2022.09.16 | මාතර | Grand Navro Hotel |
| 2022.09.20 | යාපනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.09.21 | කිලිනොච්චි/ මුලතිව් | Star Rest Hotel |
| 2022.09.22 | මන්නාරම | Julie Reception |
| 2022.10.11 | රත්නපුර | කේතුමති හෝටලය |
| 2022.10.14 | කෑගල්ල | හේෂානි හෝටලය |
| 2022.10.18 | ගාල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.10.20 | කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |

| වැඩමුළුව පැවැත් වූ දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|---|
| 2022.10.21 | මාතලේ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.10.27 | බදුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.10.28 | මොණරාගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.11.01 | මහනුවර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.11.02 | නුවරඑළිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.11.10 | මඩකලපුව | සනී ෆිෂ් හෝටලය |
| 2022.11.11 | අම්පාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.11.21 | වව්නියාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2022.11.22 | අනුරාධපුරය | රන්දිය හෝටලය |
| 2022.12.13 | පුත්තලම | කේ.ඒ. බායිස් මෙමෝරියල් ශ්‍රවණාගාරය |
| 2022.12.14 | ගම්පහ | ජයසිංහ සෙන්ටර් හෝල් |



වැඩමුළු සඳහා සහභාගී වූ පාර්ශ්වකාර කණ්ඩායම් පිළිබඳ තොරතුරු

## මෙම සාකච්ඡාවල දී ඊට සහභාගී වූ ජනතාව විසින් ඉදිරිපත් කළ අදහස් හා යෝජනා සාරාංශය

- ඡන්ද අපේක්ෂකයින් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් නියම කිරීම හා එම සුදුසුකම් ඇතුළත් ලැයිස්තුවක් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව සමඟ ඡන්දදායකයාගේ නිවසට යැවීම.
- නිශ්චිත වයස් සීමාවකින් පසු මහජන නියෝජිතයන් විශ්‍රාම යැවීම.
- මැතිවරණ වියදම් පාලනය කිරීම හා අපේක්ෂකයින් විසින් සිදුකරන වියදම් පිළිබඳ වාර්තා ලබාගැනීම, වියදම් කළ හැකි උපරිම සීමා නියම කිරීමට නීති සකස් කිරීම.
- පළාත් පාලන ආයතනවල වර්තමාන සභික සංඛ්‍යාව අඩු කිරීම.
- ඡන්ද විමසීම්වල දී පක්ෂ/ අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශ මගින් ලබාදෙනු ලබන පොරොන්දු ඉටුකිරීමට අපොහොසත් වන නියෝජිතයන් ආපසු කැඳවීමේ බලය පුරවැසියන්ට ලබාදීම.
- මාධ්‍ය උපමාන උල්ලංඝනය කරන අයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම, ප්‍රචාරණ වියදම් අවම කිරීම, මැතිවරණ ප්‍රචාරණ කාල සීමාව තවදුරටත් සීමා කිරීම. ප්‍රතිපත්ති ප්‍රකාශ ජනගත කිරීම සඳහා ජන මාධ්‍ය වේදිකාවක් සකස් කරදීම.
- සියළුම මැතිවරණ කොට්ඨාස ක්‍රමයට පැවැත්වීම.
- ආබාධිත තැනැත්තන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම, ඡන්දය ප්‍රකාශ කිරීම පිළිබඳව ඔවුනට අවබෝධ කර ගත හැකි ආකාරයට දැනුම්වත් කිරීම හා මහජන නියෝජිත ආයතනවලට ඔවුන්ගේ නියෝජනත්වය සහතික කරලීම.
- අපේක්ෂකයින්ගේ වත්කම් හා බැරකම් පිළිබඳව වාර්තා වාර්ෂිකව ලබාගැනීම.
- කාන්තා නියෝජනය තවදුරටත් ශක්තිමත් කිරීම.
- මහජන නියෝජිතයන් පක්ෂ මාරු කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කරන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම.
- මහජන නියෝජිත ආයතනවලට අනිවාර්ය තරුණ කෝටාවක් ලබාදීම.
- ආබාධිත ඡන්දදායකයින් හා වයස්ගත ඡන්දදායකයින් සඳහා නිවසේ සිට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි ජංගම ඡන්ද පොලවල් ස්ථාපිත කිරීම, ප්‍රවාහන පහසුකම් ලබාදීම හෝ ඔවුන් වෙනුවෙන් වූ පහසුකම් සහිත ඡන්ද මධ්‍යස්ථාන සකස් කිරීම.
- ඡන්දදායකයින් වෙත අල්ලස් වශයෙන් මුදල්, විවිධ ද්‍රව්‍ය ආධාර ලබාදෙන අපේක්ෂකයින් අනාවරණය කරගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ අපේක්ෂකත්වය අහිමි කිරීම පිළිබඳව නීති සම්පාදනය කිරීම.
- විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ යන්ත්‍ර හඳුන්වා දීම හා ඡන්ද විමසීම් ක්‍රියාවලිය සඳහා තාක්ෂණය යොදා ගැනීම.
- වංචා, දූෂණ චෝදනා සහිත හා අධිකරණයෙන් වරදකරුවන් වූවන් නාමයෝජනා භාර දීමේ දී එම නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කිරීම.
- ඡන්ද විමසීම්/ මැතිවරණවල දී පවත්නා මනාප ක්‍රමය අහෝසි කිරීම.
- ජාති, ආගම් හා භාෂා වශයෙන් නම් කර ඇති දේශපාලන පක්ෂ අවලංගු කිරීම.
- පක්ෂ/ අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සංඥා භාෂා මාධ්‍යයට ද පරිවර්තනය කිරීම හා එවැනි දේශපාලන රැස්වීම් රූපවාහිනියෙන් විකාශනය කිරීමේ දී සංඥා භාෂා පරිවර්තන රූපරාමු විශාල කර පෙන්වීමට කටයුතු කිරීම.
- මැතිවරණවලට පෙර ජනතාව තුළ මැතිවරණ නීති පිළිබඳව පවත්නා දැනුම, අවබෝධය වැඩි කිරීම සඳහා ජනතාව දැනුම්වත් කිරීමට පුළුල් වැඩපිළිවෙලක් සංවිධානය කිරීම.
- ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ තැනැත්තන් ජාතික ලැයිස්තුවට ඇතුළත් කිරීම වැළැක්වීම සහ එකම තැනැත්තා කිහිපවරක් ජාතික ලැයිස්තුවට ඇතුළත් කිරීම වැළැක්වීම.
- අපේක්ෂකයෙකුට දෙවරකට වඩා පාර්ලිමේන්තු මැතිවරණයකට ඉදිරිපත් වීම/ නියෝජනය කිරීම වැළැක්වීමේ නීති සම්පාදනය කිරීම.
- මැතිවරණ ප්‍රචාරක පුවරු, පෝස්ටර් ඇලවීම සඳහා ප්‍රසිද්ධ ස්ථානවල පොදු ඉඩක් වෙන් කරදීම/ පෝස්ටර් ඇලවීම සම්පූර්ණයෙන්ම ඉවත් කර ප්‍රචාරණය සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම.
- බලය බෙදා හැරීම විධිමත් කිරීම.
- පළාත් පාලන ඡන්ද විමසීම් තුළින් පක්ෂ ක්‍රමය ඉවත් කර ස්වාධීන ආයතන ලෙස කටයුතු කිරීමට ඉඩ සැලසීම.
- පාසල් විෂය නිර්දේශයට මැතිවරණ නීතිය ඇතුළත් කිරීම.
- දෘෂ්‍යාබාධිත/ කථන/ ශ්‍රවණ ආබාධිත අයට ඡන්දය රහසයව භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මාර්තු මාසයට පෙර පැවැත්වීමට කටයුතු කිරීම.
- මැතිවරණවලට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමේ දී ඉදිරිපත් වන කොට්ඨාසයේ පදිංචිය සනාථ කිරීම.
- දේශපාලන පක්ෂ මැතිවරණයකට/ ඡන්ද විමසීමකට ඉදිරිපත් වන්නේ නම් නියම කරන ලද ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමට අපොහොසත් වන පක්ෂ අත්හිටුවීම.
- ලංකාවේ ප්‍රතික්ෂේප වන ඡන්ද ප්‍රතිශතය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.
- NOTA ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ඡන්දය ප්‍රකාශ නොකරන ඡන්දදායකයින් සඳහා දඩ මුදලක් පැනවීම.
- අපේක්ෂකයින් සඳහා ආචාරධර්ම පද්ධතියක් නිකුත් කිරීම.
- ඡන්දය පැවැත්වෙන දිනයේ දී යම් යම් හේතූන් මත ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වන පුද්ගලයින් සඳහා පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබාදීම.
- මැතිවරණවල දී ආගමික පූජකවරුන් තරග කිරීම වැළැක්වීම.
- ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණ සංවිධාන සඳහා ගම් මට්ටමින් නියෝජිතයන් පත්කිරීම.
- ජනතා නියෝජිතයන් ගම් මට්ටමේ ව්‍යාපෘති සිදු කිරීමේ දී ග්‍රාමීය කමිටුවල නිර්දේශ ලබාගැනීම.

- පක්ෂ සාමාජිකයන් බඳවාගැනීම සහ ව්‍යාපෘති විවෘත කිරීම්වලට වැය කරන මුදල් එය සංවිධානය කරන පිරිස් වෙතින් අයකර ගැනීම.
- මැතිවරණවලට ඉදිරිපත් වන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සඳහා පවත්නා ඇප මුදල් ප්‍රමාණය වැඩි කිරීම.
- මැතිවරණ/ ඡන්ද විමසීම්වල දී පක්ෂයට හා පුද්ගලයාට වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට ද්විත්ව ඡන්ද පත්‍රිකාවක් ලබාදීම.
- පළාත් පාලන ආයතනවල නිල කාලය අවුරුදු 04 සිට 05 දක්වා වැඩිකිරීම.
- පාර්ලිමේන්තු මැතිවරණය සඳහා සුළු ජන නියෝජනයට අවස්ථාව ලබාදිය හැකි පරිදි මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම.
- නාමයෝජනා ලැයිස්තුවට කොට්ඨාසයෙන් පත්කිරීමට නියමිත අපේක්ෂකයන්ට අමතරව තිදෙනෙකු නම් කිරීම අනවශ්‍ය බැවින් එම සභික ප්‍රමාණය ද ජාතික ලැයිස්තුවට එකතු කිරීම.
- පළාත් පාලන ආයතනවල සීමා මායිම්වල පවත්නා ගැටළු අවම කිරීම හා නැවත සීමා නිර්ණය කිරීම.(වැව්ලි වතු අශ්‍රිතව)
- ජාතික ලැයිස්තු වෙනුවට උගත්/ බුද්ධිමත් තැනැත්තන් පක්ෂ දේශපාලනයට පරිබාහිරව දෙවන මණ්ඩලයකින් නියෝජනයට අවස්ථාව සැලසීම.
- ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ආකෘති පත්‍ර බෙදාහැරීමක් නොකරන බැවින් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම නිසි අයුරින් ඉටුවනවා ද යන්න පරීක්ෂා කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම.
- පළාත් පාලන සභිකයන්ට සභාපතිවරයා තෝරා ගැනීමේ අවස්ථාව ලබාදීම.
- තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දී තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියා ලෙස අදාළ ආයතනයේ ප්‍රධානියා වෙනුවට වෙනත් නිලධාරියෙක් තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියා ලෙස යෙදවීම.
- ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සිදු කරනු ලබන තීන්ත ආලේපන ක්‍රමය ඉවත් කිරීම.
- වයස අවුරුදු 60ට වැඩි තැනැත්තන්ට ද තරග කිරීමේ (කෝටාවක්) අවස්ථාව ලබාදීම.
- කැබිනට් අමාත්‍යධුර සීමා කිරීම හා සියලුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි එම අමාත්‍යධුර බෙදීයාම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට යෝජනා කිරීම.
- ජාතික ලැයිස්තුව සඳහා සංයුතියක් යෝජනා කිරීම.
- සමාජ මාධ්‍ය හා එක් එක් ජාතීන් වශයෙන් මෙහෙයවන මාධ්‍ය හරහා සිදුකරන ප්‍රචාරණය නියාමනය කිරීම.
- දේශපාලන පක්ෂවල නිල තනතුරු දැරීම සඳහා විශේෂ අවස්ථා සහිත තැනැත්තන්ට ද අවස්ථාව ලබාදීම.
- මැතිවරණ/ ඡන්ද විමසීම් සඳහා දින කැලැන්ඩරයක් සකස් කිරීම.
- සියළු මැතිවරණ එක දිනක දී පැවැත්වීමට කටයුතු කිරීම
- ඡන්ද ප්‍රකාශ කිරීමේ වේලාව දීර්ඝ කිරීම.

***මැතිවරණ කොමිෂන් සභාවේ සැලසුම් ඒකකයේ තොරතුරු ඇසුරැනි.**

# මැතිවරණ කොමිෂන් සභාව පිළිගත් දේශපාලන පක්ෂ - 2022

1. අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස්
2. අඛිල ඉලඞ්කෙ ද්‍රවිඩ මහාසභා
3. අපේ ජනබල පක්ෂය
4. අභිනව නිවහල් පෙරමුණ
5. අරුණාළු ජනතා පෙරමුණ
6. අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය
7. ඉලංකෙයි තමිල් අරසු කච්චි
8. ඊරෝස් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
9. ඊලවර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
10. ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
11. එක්සත් කොංග්‍රස් පක්ෂය
12. එක්සත් ජනතා නිදහස් සන්ධානය
13. එක්සත් ජනරජ පෙරමුණ
14. එක්සත් ජාතික නිදහස් පෙරමුණ
15. එක්සත් ජාතික පක්ෂය
16. එක්සත් ජාතික සන්ධානය
17. එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය
18. එක්සත් මහජන පක්ෂය
19. එක්සත් ලංකා පොදුජන පක්ෂය
20. එක්සත් ලංකා මහ සභා පක්ෂය
21. එක්සත් වාමාංශික පෙරමුණ
22. එක්සත් සමාජවාදී පක්ෂය
23. එක්සත් සාම සන්ධානය
24. කඳුරට ජනතා පෙරමුණ
25. කම්කරු ජාතික පෙරමුණ
26. ජනතා විමුක්ති පෙරමුණ
27. ජනතා සේවක පක්ෂය
28. ජනනායක තමිළ් තේසිය කූට්ටනි
29. ජනසෙත පෙරමුණ
30. ජාතික කොංග්‍රසය
31. ජාතික ජන බලවේගය
32. ජාතික ජනතා පක්ෂය
33. ජාතික නිදහස් පෙරමුණ
34. ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
35. ජාතික සංවර්ධන පෙරමුණ
36. ජාතික සමගි පෙරමුණ
37. තමිල් මක්කල් කූට්ටනි
38. තමිල් මක්කල් තේසිය කූට්ටනි
39. තමිළ් මක්කල් විඩුදලෛප් පුළිකල්
40. දමිල ප්‍රගතිශීලි සන්ධානය
41. දෙමළ සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය
42. දෙවන පරපුර
43. දේශප්‍රේමී එක්සත් ජාතික පක්ෂය
44. දේශ විමුක්ති ජනතා පක්ෂය
45. ද්‍රවිඩ ඊලාම් විමුක්ති සංවිධානය
46. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ
47. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
48. නව ප්‍රජාතන්ත්‍රවාදී මාක්ස් ලෙනින් වාදී පක්ෂය
49. නව ලංකා නිදහස් පක්ෂය
50. නව සමසමාජ පක්ෂය
51. නව සිහළ උරුමය
52. නිදහස් ජනතා පෙරමුණ
53. පිවිතුරු හෙළ උරුමය
54. පුරවැසි පෙරමුණ
55. පෙරටුගාමී සමාජවාදී පක්ෂය
56. පොදුජන එක්සත් පෙරමුණ
57. ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
58. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා කොංග්‍රසය
59. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ
60. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා විමුක්ති පෙරමුණ
61. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය
62. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
63. ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ
64. මව්බිම ජනතා පක්ෂය
65. මහජන එක්සත් පෙරමුණ
66. යහපාලනය සඳහා වූ ජාතික පෙරමුණ
67. ලංකා කම්කරු කොංග්‍රසය (දේශපාලන අංශය)
68. ලංකා ජනතා පක්ෂය
69. ලංකා සමසමාජ පක්ෂය
70. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
71. ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
72. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
73. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
74. ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ
75. ශ්‍රී ලංකා මහජන පක්ෂය
76. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය
77. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
78. ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
79. ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය
80. සමගි ජන බලවේගය
81. සමත්තුව කච්චි
82. සමබිම පක්ෂය
83. සමාජවාදී ජනතා පෙරමුණ
84. සමාජවාදී ජනතා සංසදය
85. සමාජවාදී සමානතා පක්ෂය
86. සිංහලදීප ජාතික පෙරමුණ

# නියෝජිතවරණ ගනුදෙනු සහ ප්‍රජාතන්ත්‍රවාදය



**ධම්ම දිසානායක**
*කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය*

මේ දිනවල ප්‍රාදේශීය ආණ්ඩු (කාලයක සිට භාවිතා කරන්නේ පළාත් පාලන ආයතන යන වැරදි නම ය) නියෝජිතවරණයක් ගැන නියෝජිතවරණ ප්‍රතිසංස්කරණ ගැන ජනමත විචාරණයක් ගැන පාලකයින් ඉඟි සපයන බැවින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන නියෝජිතවරණ ගැන අප තවදුරටත් කතා කළ යුතු ය. එය අපේ සමාජයේ දේශපාලන සමාජ සාක්ෂරතාව වර්ධනය ට හේතුවන කාර්යයක් යැයි මම සිතමි.

පළමුව, ආසියාවේ පැරණිතම සහ දීර්ඝ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස බොහෝදෙනා පුරුද්දට මෙන් කියාපාන මේ රට තවම එහෙම එකක් නොවන බව පාඨක ඔබේ අවධානයට යොමු විය යුතු ම යැයි යෝජනා කරමි. පැරණිතම දීර්ඝතම නියෝජිතවරණ එනම් මැතිවරණ පැවැත් වූ ආසියාතික රට ලංකාව යැයි කෙනෙකු කීවොත් එහි සත්‍යයක් ඇත. එහෙම රටවල් හැඳින්විය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ඒවා ලෙස නොව **"වරණතන්ත්‍රවාදී"** (Electocracy) ලෙස ය. නමුත් කාලාන්තරයක් තිස්සේ මේ රටේ පාලකයෝ වරණතන්ත්‍රය බලවත් කොට එය ප්‍රජාතන්ත්‍රය යැයි බොරුවක් සමාජ ගත කළහ. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නියම හරය ඉලෙක්ෂන් නැමති යකඩ ලෝගුවකින් වසා දැම්මේ ය. දැන් පාලකයෝ කියා සිටින්නේත් ජනතාව සිතා සිටින්නේත් ප්‍රජාතන්ත්‍රවාදය යනු ඉලෙක්ෂන් පැවැත්වීම ම කියා ය. එනම් වරණ තන්ත්‍රවාදය බලවත් වී ප්‍රජාතන්ත්‍රවාදය මිය ගොසින් ය, එක්කෝ වනගත වෙලා ය. මෙය එක අතකින් හෝ අඩු දියුණු රටවලට පොදු තත්ත්වයකි. ඒ බැවින් ප්‍රජාතන්ත්‍රවාදය මුහුදක් නම් ඉලෙක්ෂන් සහිත වරණතන්ත්‍රවාදය යනු එහි එක රැල්ලක් පමණක් බව වටහා ගත යුතු ය.

ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නොව නියෝජිතයෙකු යනු කවරෙක් ද? ඔහු හෝ ඇය කවර ගුණාංග සහිත වූවෙක් විය යුතු ද? නියෝජනය කරනවා යනු කුමක් ද? නියෝජිතයින්ගේ වගකීම් මොනවාද? ඔවුන් සමාජයට වගඋත්තර බැඳිය යුතු ය, නියෝජිතවරණ සර්ව සාධාරණව පවත්වන්නේ කෙසේද? ඒ සඳහා ගත යුතු රාජ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග මොනවා ද? යනාදිය පිළිබඳ බරසාර සංවාදයක් හෝ ජනතා මැදිහත් වීමක් මේ රටේ නැත. ඒ නිසා සිදු වී ඇත්තේ නියෝජිතවරණ සහිත වරණතන්ත්‍රවාදය පවා ගුණාත්මක මට්ටමකින් සිදු නොවන බවය. එබැවින් මේ රටේ වරණතන්ත්‍රවාදය ධනයෙන් සහ බලයෙන් යුත් කල්ලි, රංචු, හවුල්, සහ පවුල්වල බල ව්‍යාපෘතියක් මිස පොදු ජනයාගේ නිදහස් හැසිරීමට බාධා නැති අඩවියක් බවට පත්ව නොමැත. මෙය පෙර කී පරිදිම ලෝක තත්ත්වයකි. නමුත් ඒ නිසා අප මේ තත්ත්වය විඳදරා ගත යුතු නැත. එනම් එය වෙනස් කළ යුතු තත්ත්වයකි. මේ ලෝක සහ මහද්වීපික තත්ත්වය ගැන වූ පහත සඳහන් පැහැදිළි කිරීම් දෙක සාවධානව කියවමු.

Openmarketsinstitute වෙබ් අඩවිය (2022) හෙළිදරව් කරන කරුණු අනුව, ඇමරිකානුවන්ගෙන් තුනෙන් දෙකක්ම පවසන්නේ සාමාන්‍ය පුරවැසියෙකුට වඩා ධනවතුන් නියෝජිතවරණ ක්‍රියාවලිය තුළ වැඩි බලයක් භුක්ති විඳින බව ය. මෙම අසමතුලිතතාවට පිළියමක් ලෙස බොහෝ දෙනා විශ්වාසය තබනුයේ, ධනවත් පුද්ගලයින් නියෝජිතවරණ ව්‍යාපාර සඳහා කොපමණ මුදලක් වැය කළ හැකි ද යන්න පිළිබඳ නව සීමා අනුගමනය කිරීම පිළිබඳව ය. එහෙත් ප්‍රචාරක මූල්‍ය ප්‍රතිසංස්කරණ හරහා පමණක් දේශපාලනයට/නියෝජිතවරණ දේශපාලනයට මුදලේ බලපෑම පාලනය කිරීමට උත්සාහ කිරීම ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ගැටලුසහගතය. එක් හේතුවක් නම් දේශපාලන වියදම් යනු ආරක්ෂිත භාෂණයේ ආකාරයක් බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවධාරණය කොට තිබීම ය. අනෙක 90 දශකයේ අග භාගයේ මෘදු මුදල් භාවිතයේ සිට අද සුපිරි මුදල් උපයන්නන් සෑම විටම රෙගුලාසි මග හැරීමේ දී පෙන්නුම් කර ඇති දක්ෂතාවය යි. Political Action Committee - PAC යනු එක්සත් ජනපදයේ, දේශපාලන ක්‍රියාකාරී කමිටුවකි. එය සාමාජිකයින්ගේ ප්‍රචාරක දායකත්වය එකතු කරන දේශපාලන කමිටුවක් වන අතර එම අරමුදල් අපේක්ෂකයින් සඳහා හෝ විපක්ෂව ප්‍රචාරක කටයුතු සඳහා, ඡන්ද මුලපිරීම් හෝ නීති සම්පාදනය සඳහා පරිත්‍යාග කරයි.

ඉහත වෙබ් අඩවිය තවදුරටත් පෙන්වා දෙන ආකාරයට මහා ව්‍යාපාරිකයන් සහ ධනවත් පරිත්‍යාගශීලීන් ලොබිකරුවන්ට සහ බුද්ධි මණ්ඩලවලට අරමුදල් සම්පාදනය කරන අතර **"අනුග්‍රහය දක්වන"** පර්යේෂණ සහිත දූෂිත ශාස්ත්‍රීය විද්‍යාව සහ ජනප්‍රිය මාධ්‍ය ප්‍රකාශන ප්‍රවෘත්ති ජාලවලට වඩා බලවත් වී ඇත. මෙම සියලු යාන්ත්‍රණ හරහා, මහජන විවාදයන්හි තොරතුරු ගලායාම පාලනය කිරීමටත්, ජාතික දේශපාලන න්‍යාය පත්‍රයේ කොටසක් බවට පත්වන්නේ කුමන ප්‍රශ්න ද යන්න තීරණය කිරීමටත්, සීමාවේ පවතින කාරණා තීරණය කිරීමටත් ධනහිමියන් ට හැකි ය. ඇමරිකානුවන්ගේ පෙර පරම්පරා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය පවත්වා ගැනීම සඳහා වෙනස්

ප්‍රවේශයක් අනුගමනය කළහ. ඔවුන් දේශපාලන දූෂණයට එරෙහිව සටන් කර ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළේ ඒකාධිකාරය සහ ආර්ථික බලය ගොඩගැසීම වළක්වන ආකාරයෙන් වෙළඳපල නීති රීති සැකසීමෙනි. ශත වර්ෂයකට පෙර ජේ.පී. මෝගන් වැනි දුම්රිය, වානේ සහ බැංකු අධිපතියන්ගේ බලයේ උච්චතම අවස්ථාවෙහි දී, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ලූවී බ්‍රැන්ඩිස් පැහැදිලි කළේ **"අපට ප්‍රජාතන්ත්‍රවාදය තිබිය හැකි ය, නැතහොත් අපට ධනය කිහිප දෙනෙකු අත සංකේන්ද්‍රණය වී (ගොඩගැසී) තිබිය හැකි ය. නමුත් අප ට දෙකම තිබිය නොහැක"** යනුවෙනි. තවද, ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා දැඩි විශ්වාසභංග ක්‍රියාමාර්ගයක (Antitrust action) අවශ්‍යතාව පැහැදිලි කරමින් ජනාධිපති වුඩ්‍රෝ විල්සන් ප්‍රකාශ කළේ, **"එක්සත් ජනපදයේ ආණ්ඩුව අයිති කර ගැනීමට තරම් විශාල මිනිසුන් මේ රටේ සිටී නම්, ඔවුන් එය අයිති කර ගැනීමට යන්නේ ය"** යනුවෙනි.

නියෝජිතවරණ ව්‍යාපාර අලෙවිකරණ සහ ගනුදෙනු ක්‍රියාවලි විසින් මෙහෙයවන ආකාරය පිළිබඳ උදාහරණ සහිතව පැහැදිළි කරන ලී ක්වාන් යූ විසින් රචිත From Third World to First· The Singapore Story 1965-2000(Lee Kuan Yew (2000)) කෘතියෙහි දහසය වැනි පරිච්ඡේදය දේශපාලන විකුණුම් මිල දී ගැනීම් නැතහොත් ගනුදෙනු තේරුම් ගැනීමෙහිලා ඉතා වැදගත් ය. එහි සඳහන් වන ආකාරයට ආසියාවේ බොහෝ රටවල් අධික නියෝජිතවරණ පිරිවැයක් දරති. අපේක්ෂකයෙකු තේරී පත්වීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරන අතර තේරීපත් වූ පසු වැය වූ මුදල් පියවා ගැනීමට සහ ඉදිරි නියෝජිතවරණ සඳහා අරමුදල් රැස්කිරීමට ක්‍රියා කිරීම සාමාන්‍ය තත්ත්වයකි. 1990 දශකයේ දී තායිවානයේ ව්‍යවස්ථාදායක මණ්ඩලය වූ යුවාන් ආයතනයට තේරී පත් වීම සඳහා කුවෝ මිං ටෑන් පක්ෂයේ ඇතැම් අපේක්ෂකයෝ ඇමෙරිකානු ඩොලර් මිලියන 10-20 ක් තරම් විශාල ප්‍රමාණයක් වැය කොට තිබුණි. හිටපු තායිලන්ත ඇමතිවරයෙකු මේ තත්ත්වය නම් කළේ **"වාණිජ ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් මිලයට ගත් ජන වරම"** ලෙස ය. 1996 දී එම රටේ අපේක්ෂකයන් 2000 කට ආසන්න පිරිසක් බාත් බිලියන 30 ක් එනම් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2 ක් නියෝජිතවරණය සඳහා වැය කොට තිබුණි. අපේක්ෂකයින්ට සහ ඡන්ද හිමියන්ට මුදල් බෙදන එරට එක් අගමැතිවරයෙකු සඳහා වූ අන්වර්ථ නාමය වූයේ "Mr.ATM" (Automatic Teller Machine) යන්නය. ඊට ඔහුගේ ප්‍රතිචාරය වූයේ තමා එකම "ATM" නොවේ යන්න ය. මැලේසියාවේ එක්සත් මැලේ ජාතික සංවිධානයේ නායකයින් එය හඳුන්වනුයේ **"මුදල් දේශපාලනය"** නමිනි. ඉහළ තනතුරු සඳහා තරඟ වදින අපේක්ෂකයින් ඉන් ජය ගැනීම සඳහා ඡන්ද හිමි නියෝජිතයින්ට අල්ලස් සහ තෑගි ලබා දෙන බව අගමැති මහතීර් මොහොමඩ් වරෙක හෙළිදරව් කළේ කඳුළු සලමිනි. ඉන්දුනීසියාවේ තත්ත්වය ද ඊට සමාන බව ලී ක්වාන් යූ පෙන්වා දී තිබේ. එරට මාධ්‍ය KKN නමින් හඳුන්වනුයේ Kolusi (අපරාධ සඳහා හවුල් වීම සහ ක්‍රියා කිරීම), Korupsi (දූෂණය), Nepotism (ඥාති සංග්‍රහය) යන ක්‍රියාවලිය ය. ජපානය මිල අධිකම නියෝජිතවරණ ක්‍රමයක් නඩත්තු කරන බව ලී ක්වාන් යූ ගේ අදහස ය. එනම්, නියෝජිතවරණ වසරක දී අපේක්ෂකයෙකුට ඩොලර් මිලියන පහකට අධික මුදලක් අවශ්‍ය වේ. ඒ සඳහා ඔහු සිය නායකයා දෙසට යොමු වේ. නායකයාගේ ශක්තිය රඳා පවතින්නේ ඔහුට සමීප සහ හිතවත් මන්ත්‍රීන් සංඛ්‍යාව මත බැවින් අනුගාමිකයින් වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට නායකයා ට සිදුවේ.

ජන සන්නිවේදන මාධ්‍ය පූර්ණ නිදහසක් සහිතව ක්‍රියාත්මක වන විට ඒවා මගින් දූෂණ ක්‍රියා හෙළිදරව් කරන නිසා පිරිසිදු සහ අවංක ආණ්ඩු ගොඩනැගෙනු ඇති බවට වූ ලිබරල් අදහස කෙරෙහි ලී ක්වාන් යූ සැක මතු කළේ ය. එවැනි නිදහසක් ඇති ඉන්දියාවේ, පිලිපීනයේ, තායිලන්තයේ, තායිවානයේ, දකුණු කොරියාවේ, සහ ජපානයේ දූෂණය ගැඹුරට මුල්බැස ගෙන ඇති බව මෙම කෘතිය තුළින් පෙන්වා දී තිබේ. ඔහු මතුකරන වැදගත්ම අදහස වනුයේ ජනමාධ්‍ය හිමිකරුගේ දූෂණ ක්‍රියාවල සහයක පාර්ශ්වයක් ලෙස නිදහස් ජන මාධ්‍යම පත්වී ඇත යන්න ය. ඔහු ඊට උදාහරණයක් ලෙස ඉදිරිපත් කොට ඇත්තේ ජනමාධ්‍ය පද්ධතියක හිමිකරු වන හිටපු ඉතාලි අගමැති සිල්වියෝ බෙර්ලුස්කෝනි ය. මේ ගැටලුව ජය ගැනීමට ලී ක්වාන් යූ ඉදිරිපත් කර ඇත්තේ පිරිසිදු, සහ මුදල් වැය නොවන නියෝජිතවරණ ක්‍රමයක් ය.

මේ අනුව බලන විට නියෝජිතවරණ සහ පාර්ලිමේන්තුව යනු ප්‍රජාතන්ත්‍රවාදය ය කියා පාලකයින් නගන හඬ සත්‍යයක් නොවන බව ඔබට වැටහෙනු ඇත. එසේම නියෝජිතවරණ නමට පමණක් නියෝජිතවරණ වී ඒවා ධනය සහ බලය ඇති අයගේ උපකරණ හෝ මෙවලම් බවට පත්වෙන බවත් ඔබට වැටහෙනු ඇත. එවැනි නියෝජිතවරණ වනාන්තරයක අතරමං කර ඇති නියෝජිතතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන සංස්කෘතිය මේ රටේ සොයා මතු කර ගැනීමට නම් පොදු ජනයාගේ සමාජ දේශපාලන සාක්ෂරතා අවබෝධය වැඩි දියුණු කරගත යුතු ය.

# හැමිල්ටන් ක්‍රමයේ තවත් දෝෂ

**ආචාර්ය ජයන්ත සේනාධීර**
ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ ගණිත අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**(පසුගිය ලිපිය හා සම්බන්ධිතයි)**

ගියවර ලිපියෙන් අපි හැමිල්ටන් ක්‍රමයේ අන්තර්ගත ඇලබාමා විරුද්ධාභාෂය පිළිබඳව සවිස්තරව සාකච්ඡා කළෙමු. හැමිල්ටන් ක්‍රමය අපට විශේෂයෙන් වැදගත් වන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ද ඒ ඒ දිස්ත්‍රික්කවලට බෙදා දෙනු ලබන මන්ත්‍රීන් සංඛ්‍යාව නිර්ණය කරනු ලැබූ ක්‍රමවේදයක් වීමයි. මේ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(4), 98(5) හා 98(6) ව්‍යවස්ථා කියවීමෙන් ඔබට පසක් කර ගත හැකි ය. හැමිල්ටන් ක්‍රමයේ අන්තර්ගත මුලින් හඳුනාගත් ඇලබාමා විරුද්ධාභාෂයට අමතරව "ජනගහන විරුද්ධාභාෂය" සහ "නව ජනපද විරුද්ධාභාෂය" නමින් හඳුන්වන තවත් විරුද්ධාභාෂ දෙකක් අන්තර්ගත වේ. අද අපි මෙම විරුද්ධාභාෂ දෙක පිළිබඳව සලකා බලමු. පළමුව අපි ජනගහන විරුද්ධාභාෂය කල්පිත කථාවක් ඇසුරෙන් අවබෝධ කර ගනිමු.

## ජනගහන විරුද්ධාභාෂය (Population Paradox)

කැකිරිගොඩ ග්‍රාම නිලධාරී වසම සමන්විතව ඇත්තේ ටිකිරිගම, ගිගිරිගම, විසිරිගම, මිහිරිගම සහ පිපිරිගම යන ගම්මාන පහෙනුයි. කැකිරිගොඩ ග්‍රාම නිලධාරී වසමට ගම් පහේම නියෝජිතයින්ගෙන් සමන්විත ග්‍රාම සංවර්ධන සමිතියක් ඇත. සමිතියේ ව්‍යවස්ථාවට අනුව ග්‍රාම නිලධාරී වසමට කිසියම් පොදු ප්‍රතිලාභයක් ලැබෙන්නේ නම් එය එක් එක් ගම්මානයේ පවුල් සංඛ්‍යාවට සමානුපාතිකව ලබා දිය යුතුයි. වැඩිදුරටත් එහි සඳහන් වන්නේ නිශ්චිතව එම සංඛ්‍යාවන් ගණනය කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(4), 98(5), 98(6) සහ 98(7) ව්‍යවස්ථාවල ඇතුළත් ශිල්පීය ක්‍රමය (එනම් හැමිල්ටන් ක්‍රමය) භාවිත කළ යුතු බවයි. පසුගිය කලාපවල ලිපි කියවූ ඔබ මෙම ක්‍රමය කුමක්දැයි හොඳින්ම අවබෝධ වී ඇතැයි සිතමි. මෙවර කැකිරිගොඩට පොදු ළිං 50 ක් ලැබීමට නියමිතයි. ග්‍රාම සංවර්ධන සමිති රැස්වීමේ දී ඒ බව දැනුම් දුන්නා පමණක් නොවෙයි, ඒ වන විට ගම්මාන පහේ සිටින පවුල් සංඛ්‍යාව අනුව පොදු ළිං කීය බැගින් හිමිවිය යුතු දැයි තීරණය කළහ.

පහත වගුවෙන් දැක්වෙන්නේ අදාළ ගණනය කිරීම් අනුව, ජනගහනය 899 ක් සහ ළිං ප්‍රමාණය 50 ක් බැවින් එක ළිඳකට සාමාන්‍ය ජනගහනය වන 17.98, සම්මත භාජකය වනවා. නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(4) අනු ව්‍යවස්ථාව අනුව "සම්මත භාජකයේ" ශේෂ කොටස අතහැර පූර්ණ සංඛ්‍යාව පමණක් සලකනු ලබනවා. එය පරිමිත සංඛ්‍යාව ලෙස හඳුන්වනවා. ඒ අනුව මෙම ගැටලුවේ එම පරිමිත සංඛ්‍යාව වන 17 නැවත සම්මත භාජකය වනවා. එක එක කොට්ඨාසයේ ජනගහනය පරිමිත සංඛ්‍යාවෙන් බෙදීමෙන් සම්මත කොටස ලැබෙනවා. මේ අවස්ථාවේ සම්මත කොටස්වල පහළ පූර්ණ සංඛ්‍යාවල එකතුවෙන් 50 සෑදෙන බැවින් ශේෂ කොටස් (ඉතිරි කොටස්) සලකා බැලීම අනවශ්‍ය වේ.

*සාමාන්‍යයෙන් හැමිල්ටන් ක්‍රමයේ දී සම්මත භාජකය ලෙස රටේ ජනගහනය (හෝ ඡන්ද හිමි නාම ලේඛනයේ සංඛ්‍යාව) ආසන සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන සංඛ්‍යාව (එය පූර්ණ සංඛ්‍යාවක් නොවුවත්) භාවිතා කරනවා. නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(4) අනුව එහි දශම කොටස අතහැර පූර්ණ සංඛ්‍යාව පමණක් සම්මත භාජකය ලෙස ගනී. එය "පරිමිත සංඛ්‍යාව" ලෙස ද හඳුන්වයි.

**සම්මත භාජකය 17**

| ගම | ටිකිරි | මිහිරි | විසිරි | ගිගිරි | පිපිරි | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනගහනය | 150 | 79 | 174 | 203 | 293 | 899 |
| සම්මත කොටස | 8.82... | 4.64... | 10.23... | 11.94... | 17.23... | |
| පහළ පූර්ණ සංඛ්‍යාව | 8 | 4 | 10 | 11 | 17 | 50 |
| බෙදා වෙන් කිරීම | 8 | 4 | 10 | 11 | 17 | 50 |

මේ ගණනය කිරීම් සිදුකර එක් එක් ගම්මානවලට ලැබෙන ළිං සංඛ්‍යාව දැනුම් දුන් පසු, හදිසියේම විසිරි ගමේ නියෝජිතයින්ට මතක් වුනේ මීළඟ ග්‍රාම සංවර්ධන සමිති රැස්වීම වන විට තම ගම්මානයේ අලුතින් විවාහ කිහිපයක්ම සිදුවන බැවින්, එවිට තම ගම්මානයේ පවුල් සංඛ්‍යාව කිහිපයකින් වැඩිවන බවයි. ඒ වගේම අනෙක් ගම්මානවල අලුත් විවාහ එපමණට සිදු නොවන බවද ඔවුන් දැනගෙන සිටියා. මේ තත්ත්වයේ වාසිය ගැනීමට විසිරි ගමේ නියෝජිතයින් තීරණය කළා. පිපිරි ගමේ සිටින පවුල් බොහොමයක්ම විසිරි ගමේ නෑදෑයෝ. විසිරි ගමේ නියෝජිතයින් වහාම පිපිරි ගමේ නියෝජිතයින්ට කථාකොට ඔවුන්ගේත් අනුමැතිය සහිතව අදාළ ළිං ප්‍රමාණය බෙදා ගැනීම, ඊළඟ ග්‍රාම සංවර්ධන සමිති රැස්වීම දක්වා කල් දැමීමටත්, අදාළ ගණනය කිරීම් ඒ

වන විට ගම්මාන වල සිටින පවුල් සංඛ්‍යාව අනුව සිදුවිය යුතු බවටත් යෝජනාවක් ගෙනාවා. නියෝජිතයින්ගේ බහුතර බලය මේ ගම්මාන දෙක සතුව පවතින නිසා අදාළ යෝජනාව සම්මත කර ගැනීමට අපහසු වුනේ නැහැ.

මෙසේ මාස කිහිපයක් ගතවුණා. ඊළඟ ග්‍රාම සංවර්ධන සමිති රැස්වීම වන විට විසිරි ගමේ පවුල් සංඛ්‍යාව 174 සිට 180 දක්වා වැඩි වුනා. පිපිරි ගමේ පවුල් සංඛ්‍යාව ද 293 සිට 294 දක්වා වැඩි වුනා. කෙසේ වෙතත් ටිකිරි, මිහිරි සහ ගිගිරි ගම්වල පවුල් සංඛ්‍යාවේ කිසිම වෙනසක් වී නොතිබුණ බැවින් මේ නව වෙනස අනුව අදාළ ගණනය කිරීම් සිදුකර බලමු. ජනගහනය 906 ක් සහ ළිං ප්‍රමාණය 50 ක් බැවින් එක ළිඳකට සාමාන්‍ය ජනගහනය 18.12 වනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(4) වගන්තිය අනුව සම්මත භාජකයේ ශේෂ කොටස අතහැර පූර්ණ සංඛ්‍යාව පමණක් සලකනු ලබනවා. එය එනම් 18, පරිමිත සංඛ්‍යාව ලෙස හඳුන්වනවා. 98(5) අනුව එක එක කොට්ඨාසයේ ජනගහනය 18 න් බෙදීමෙන් සම්මත කොටස ලැබෙනවා. අනතුරුව එහි පහළ පූර්ණ සංඛ්‍යාව ලබා දෙනවා. පහළ පූර්ණ සංඛ්‍යාවල එකතුව 49 බැවින් වැඩිම ශේෂ කොටස ඇති මිහිරි ගමට තව එක් ළිඳක් හිමිවෙනවා

| ගම | ටිකිරි | මිහිරි | විසිරි | ගිගිරි | පිපිරි | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනගහනය | 150 | 79 | 180 | 203 | 294 | 906 |
| සම්මත කොටස | 8.82... | 4.38... | 10 | 11.27... | 16.33... | |
| පහළ පූර්ණ සංඛ්‍යාව | 8 | 4 | 10 | 11 | 16 | 49 |
| ඉතිරි කොටස | 0.33 | 0.38... | 0 | 0.27... | 0.33... | |
| ඉතිරි කොටසේ පිළිවෙල (ළිං හිමි) | - | පළමු | - | - | - | |
| බෙදා වෙන් කිරීම | 8 | 5 | 10 | 11 | 16 | 50 |

කුමක්ද මේ සිදුවී ඇත්තේ? පිපිරි ගමේ පවුල් සංඛ්‍යාව එකකින් වැඩි වී ඇතත් ඔවුන්ට එක් ළිඳක් අහිමි වී තිබෙනවා. විසිරි ගමේ පවුල් සංඛ්‍යාව 6 කින් වැඩි වුවද ඔවුන්ට හිමි වූයේ පෙර පැවති ළිං සංඛ්‍යාවම වේ. මිහිරි, ටිකිරි හා ගිගිරි ගම්මානවල පවුල් සංඛ්‍යාව වෙනස් වුනේ නැහැ. එහෙත් මිහිරි ගම්මානයට එක් ළිඳක් වැඩියෙන් හිමි වෙලා. ටිකිරි හා ගිගිරි ගම්මාන සඳහා පෙර ළිං සංඛ්‍යාවම හිමි වෙලා. සමස්ථයක් වශයෙන් මේ ප්‍රතිඵලය මෙසේ අර්ථ කථනය කළ හැකියි. "විසිරි හා පිපිරි ගම්මාන එකතු වී ජන බලය වැඩි කරගෙන තිබුණ ද, ඒ හේතුව නිසාම ඔවුන් එක් ළිඳක් අහිමි කරගෙන." "ජනගහන විරුද්ධාභාෂය" යැයි හඳුන් වන්නේ මෙවැනි ආකාරයේ සංසිද්ධිය වේ. හරියටම පැහැදිලි කළොත් එය මේ ආකාරයට අර්ථ දක්වන්න පුළුවන්.

"කිසියම් මැතිවරණ කොට්ඨාසයක, කිසියම් කාල පරාසයක් තුළ කොට්ඨාසයේ ජනගහනය වැඩිවීමේ සීඝ්‍රතාව ය, තවත් මැතිවරණ කොට්ඨාසයක ජනගහනය වැඩිවීමේ සීඝ්‍රතාව වඩා වැඩියෙන් තිබිය දී, අදාළ කාල පරාසයේ පෙර සහ පසු ආසන වෙන් කිරීම් අනුව, ජනගහනය වැඩිවීමේ සීඝ්‍රතාව වැඩි මැතිවරණ කොට්ඨාසයට අවාසියක් සිදු වේ නම් එය ජනගහන විරුද්ධාභාශය ලෙස හැඳින් වේ."

## නව ජනපද විරුද්ධාභාශය

හැමිල්ටන් ක්‍රමය යටතේ සිදුවන නව ජනපද විරුද්ධාභාශය වර්ෂ 1907 දී ඔක්ලහෝමා ප්‍රාන්තය එක්සත් ජනපදයට සම්බන්ධ වීමේ දී දක්නට ලැබේ.

එවකට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 386 ක් වූ අතර ඔක්ලහෝමා ප්‍රාන්තයේ ජනගහනය අනුව එයට ආසන 05 ක් හිමි විය යුතු බැවින් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 386 සිට 391 දක්වා වැඩි විය. සාධාරණ යුක්තිය අනුව ඔක්ලහෝමා ප්‍රාන්තය නිසා ආසන සංඛ්‍යාව 386 සිට 391 දක්වා වැඩි වීමේ දී, අවස්ථා දෙක වෙන වෙනම ගණනය කිරීමේ දී කිසියම් ප්‍රාන්තයකට අඩුම තරමේ පෙර අවස්ථාවේ පැවති ආසන සංඛ්‍යාව ලැබීමවත් සහතික විය යුතු ය. එහෙත් ඇත්තටම සිදු වූ කරුණක් වූයේ ඔක්ලහෝමා සම්බන්ධ වීමට පෙර නිව්යෝර්ක් ප්‍රාන්තයට හිමිවිය යුතුව තිබූ ආසන 38 ඔක්ලහෝමා සම්බන්ධ වීමට පසු 37 දක්වා අඩු වීමය.

තවදුරටත් අපි කල්පිත සිද්ධියක් මගින් නව ජනපද විරුද්ධාභාශය හරියටම තේරුම් ගමු. කැකිරිලන්තයේ මැතිවරණ කොට්ඨාස දෙකකින් සමන්විත ප්‍රාන්තයක් පවතී. ගුරුළුපොත සහ බොරළුකෙත එම කොට්ඨාස දෙකයි. ප්‍රාන්තයේ මුළු ආසන සංඛ්‍යාව සියයකි. හැමිල්ටන් ක්‍රමය අනුව, සම්මත භාජකය 1000 යටතේ (ඡන්ද හිමි නාම ලේඛනයේ 1000 කට එක් මන්ත්‍රී වරයෙක්), ආසන වෙන්කිරීම මෙබඳුය.

**සම්මත භාජකය 1000**

| කොට්ඨාසය | ගුරුළුපොත | බොරළුකෙත | මුළු එකතුව |
|---|---|---|---|
| ජනගහනය(ඡන්ද හිමි නාම ලේඛනය) | 10450 | 89550 | 100,000 |
| සම්මත කොටස | 10.45 | 89.55 | 100.00 |
| පහළ පූර්ණ සංඛ්‍යාව | 10 | 89 | 99 |
| ඉතිරි කොටස | 0.45 | 0.55 | 1 |
| ඉතිරි කොටසේ පිළිවෙල | | පළමු | |
| බෙදා වෙන් කිරීම | 10 | 90 | 100 |

දැන් එරට සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන්නේ අසරුපෙත නම්, ඡන්ද හිමි නාම ලේඛනයේ සංඛ්‍යාව 5250 ක් වූ නව මැතිවරණ කොට්ඨාසයක් ප්‍රාන්තයට සම්බන්ධ වන බවය. ඒ අනුව ප්‍රාන්තයේ ආසන සංඛ්‍යාව 105 දක්වාත් ජනගහනය 105250 දක්වාත් ඉහළ යයි. එවිට ආසනයකට සාමාන්‍ය ජනගහනය නොහොත් සම්මත භාජකය දශම ස්ථාන දෙකකට නිවැරදිව 1002.38 ක් වේ. දැන් එක් එක් කොට්ඨාසයට හිමි වන ආසන සංඛ්‍යාව ගණනය කරමු.

**සම්මත භාජකය 1000.38**

| කොට්ඨාසය | ගුරුළුකෙත | බොරළුකෙත | අසරුපෙත | මුළු එකතුව |
|---|---|---|---|---|
| ජනගහනය(ඡන්ද හිමි නාම ලේඛනය) | 10450 | 89550 | 5250 | 105,250 |
| සම්මත කොටස | 10.42 | 89.34 | 5.24 | 105.00 |
| පහළ පූර්ණ සංඛ්‍යාව | 10 | 89 | 5 | 104 |
| ඉතිරි කොටස | 0.42 | 0.34 | 0.24 | 1 |
| ඉතිරි කොටසේ පිළිවෙල | පළමු | | | |
| බෙදා වෙන් කිරීම | 11 | 89 | 5 | 105 |

සිදුවූයේ කුමක්ද? හුදෙක් අසරුපෙත එම ජනගහනයට හිමි ආසන සංඛ්‍යාවත් රැගෙන ප්‍රාන්තයට සම්බන්ධවීමේ දී බොරළුකෙතට පෙර තිබූ ආසන සංඛ්‍යාවෙන් එකක් අහිමි විය. මෙය නව ජනපද විරුද්ධාභාෂයයි. එය මේ ආකාරයට විධිමත් ලෙස අර්ථ දැක්විය හැකියි.

"නව ජනපදයක් එයට හිමි ආසන ප්‍රමාණයත් රැගෙන සම්බන්ධ වීමේ දී නව ගණනය තුළ, අනෙකුත් ජනපදයකට හිමිව තිබූ ආසන ප්‍රමාණයක් අහිමි වන්නේ නම් එය නව ජනපද විරුද්ධාභාෂයයි."

දැන් ඔබ විසින් හැමිල්ටන් විධික්‍රමයේ අන්තර්ගත විරුද්ධාභාෂ තුනක් හඳුනාගන්නා ලදි. මෙම දෝෂ හැරුණුවිට හැමිල්ටන් ක්‍රමයේ ඇති ධනාත්මක ලක්ෂණ කවරේද? එහි ප්‍රධාන ධනාත්මක ලක්ෂණයක් නම් "කොටස් නීතිය" පිළිපැදීමයි. දැන් අපි කොටස් නීතිය යනු කුමක්දැයි විමසා බලමු.

## කොටස් නීතිය (Quota Rule)

අප විසින් මෙම සඟරාවේ 2022 ජනවාරි-අප්‍රේල්, කලාපයේ හැමිල්ටන් විධි ක්‍රමය පිළිබඳව විධිමත් විස්තරයක් ඉදිරිපත් කරන ලදි. එහිදී අවශ්‍යවන තාක්ෂණික වචන කිහිපයක පැහැදිලිකිරීම් ද ලබා දෙන ලදි. ඉන් එක් වචනයක් වන "සම්මත භාජකය" පිළිබඳව සිහි කැඳවීමක් කරන්නේ නම් ආසනයක් සඳහා වන සාමාන්‍ය ජනගහනය සම්මත භාජකය වේ. (ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දී, ශේෂ කොටස අතහැර ගන්නා වූ පූර්ණ සංඛ්‍යාව සම්මත භාජකය වේ) කොට්ඨාසයක ජනගහනය සම්මත භාජකයෙන් බෙදීමෙන් ලැබෙන්නේ සම්මත කොටසයි. සම්මත කොටසට පූර්ණ සංඛ්‍යාවක් ලැබීම අනිවාර්ය නොවේ. සමානුපාතිකව බෙදා වෙන්කිරීමේ ගැටලුව සංකීර්ණ වන්නේ මෙහිදී ය. ශ්‍රී ලංකාවේ ද භාවිතා කරන හැමිල්ටන් විධික්‍රමය මෙම ගැටලුව සඳහා භාවිත වන එක් විධික්‍රමයක් පමණකි. ඇඩම්ස්ගේ ක්‍රමය, ජෙෆර්සන් ක්‍රමය, වෙබ්ස්ටර් ක්‍රමය, ඩීන්ගේ ක්‍රමය, ලොන්ඩ්සන්ගේ ක්‍රමය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ දැනට භාවිතා කරන හන්ටින්ටන් - හිල් ක්‍රමය මේ සඳහා භාවිත වන අනෙක් විධික්‍රම සමහරෙකි. මේ විධික්‍රමවල තිබිය යුතුයැයි අපේක්ෂා කරන වැදගත් නිර්ණායකයක් ඇත. එය නම් "කොටස් නීතියයි".

කිසියම් මැතිවරණ කොට්ඨාසයකට අවසානයේ හිමි විය යුතු ආසන සංඛ්‍යාව, අනිවාර්යයෙන්ම එහි සම්මත කොටසේ ආසන්නම ඉහළ පූර්ණ සංඛ්‍යාව හෝ ආසන්නම පහළ පූර්ණ සංඛ්‍යාව වීම කොටස් නීතිය ලෙස හඳුන්වනු ලැබේ. ඉහත සඳහන් කළ සමහර විධික්‍රම කොටස් නීතිය පිළි නොපදී. හැමිල්ටන් ක්‍රමය කොටස් නීතිය පිළිපදින විධික්‍රමයකි. හැමිල්ටන් ක්‍රමයේ අනෙක් ධනාත්මක ලක්ෂණ වන්නේ එය ගණිතමය වශයෙන් සරල වීමත් ස්වභාවිකවම එය සාධාරණ ක්‍රමයක් ලෙස සාමාන්‍ය පුද්ගලයෙකුට ඒත්තු ගැන්වීමට හැකි වීමත් ය. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල අදාළ මැතිවරණ කොට්ඨාසවලට හිමි ආසන සංඛ්‍යාව තීරණය කිරීමේ දී භාවිත වන මූලික මූලධර්මය හැමිල්ටන් ක්‍රමයයි. එබැවින් හැමිල්ටන් ක්‍රමය පිළිබඳව මනා අවබෝධයක් තිබීම වැදගත් වේ.

මීළඟ ලිපියෙන් සීමා නිර්ණයේ දී වැදගත් සංසිද්ධියක් වන "ජෙරි මැන්ඩරින්" යනු කුමක්දැයි විමසා බලමු. ඒ සමඟම සීමා නිර්ණයේ දී, ජෙරි මැන්ඩරින් කොපමණ ප්‍රමාණයකට සිදු වී ඇත්දැයි මැන බැලිය හැකි ගණිතමය උපකරණ මොනවාදැයි විමසා බලමු.

### ආශ්‍රිත ග්‍රන්ථ


1.Excursions of Modern Mathematics - **Peter Tannenbaum (2009)**

2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

# ප්‍රජාතන්ත්‍රවාදය සහ කාන්තාව



ආචාර්ය නීලා ගුණසේකර

ප්‍රජාතන්ත්‍රවාදය යනු කාන්තා සම සහභාගිත්වයෙන් පාලන තීරණ ගැනීමයි. කාන්තාව ද පාලනයට සම්බන්ධ වුවහොත් පමණක් රටක ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ ක්‍රියාවට නැංවිය හැකි වේ. පුරවැසි සහභාගිත්වය, දේශපාලන තරඟකාරීත්වය, නීතියේ පාලනය යන කරුණු මත ප්‍රජාතන්ත්‍රවාදය සාක්ෂාත් කර ගැනීමට කාන්තා සම සහභාගිත්වය ලබා ගත යුතුව ඇත. විනිවිදභාවය තුළින් සමාජ සාරධර්මවලට අනුව ප්‍රජාතාන්ත්‍රීය වර්ධනයක් ඇති කිරීමෙහි ලා කාන්තා සහභාගිත්වය අත්‍යවශ්‍ය වේ. නිර්මාණශීලී හැකියාවන් ඇති නායකත්වයක් බිහි කළ හැකි වන්නේ ද කාන්තා සහභාගිත්වය ලබා ගැනීමෙන් පමණකි.

බොහෝ කලක සිට ග්‍රාමීය මට්ටමේ සමිති සමාගම්වල සාමාජිකත්වය පමණක් නොව රැස්වීම්වලට සහභාගි වන වැඩි දෙනා කාන්තාවන්ය. මෙම තත්ත්වය අනුව දේශපාලන සහභාගිත්වය, නායකත්වය සඳහා ඔවුන්ට අත්වැලක් වන්නේ ය. ගම් මට්ටමෙන් පටන් ගන්නා කාන්තා නියෝජිතත්වය හරහා කාන්තාවන්ට පළාත් සභා සහ පාර්ලිමේන්තුව දක්වා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් වේ. සියළුම දකුණු ආසියාතික රටවල් ගෙන බලන විට කාන්තා දේශපාලන නියෝජනය පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නා නීති තුළින් ලබා ගත් බව පැහැදිලි වේ.

කාන්තාව සහ ප්‍රජාතන්ත්‍රවාදය ගැන සාකච්ඡා කිරීමේ දී විශ්වවිද්‍යාලවල සහ වෘත්තීය ගණයට අයත් රැකියාවන්හි වැඩිපුර සිටින්නේ කාන්තාවන්ය. එහෙත් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් හෝ වෘත්තීය සංගම්වල කාන්තාවන් තනතුරු දරන්නේ සීමිත සංඛ්‍යාවකි. තිරසාර සංවර්ධන ඉලක්ක 17 න් 05 වන ඉලක්කය වන්නේ මෙයයි.

**"Achieve Gender Equality and Empower All Women & Girls"**

**"ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කර සියළු කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම"**

මෙහි දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කර ගැනීමෙන් මතු වන්නේ ද ප්‍රජාතාන්ත්‍රවාදයයි. අද දවසේ කාන්තාව කිසියම් ප්‍රමාණයකට ප්‍රජාතාන්ත්‍රවාදයේ අරමුණු සාක්ෂාත් කරගෙන ඇති බව මෙම සංඛ්‍යාලේඛනවලින් අපට තහවුරු වේ.

- ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය 60% ක් ලෙස ගණනය කර ඇත.
- කාත්තාවන්ගේ අධ්‍යාපන මට්ටම රැකියා ක්ෂේත්‍රයේ දී පිරිමින්ට වඩා ඉහළය. අ.පො.ස. උසස් පෙළ සහ ඉහළ විභාගවලින් සමත් වන කාන්තාවන්ගේ ප්‍රතිශතය 24.8% කි. පුරුෂයින්ගේ එම ප්‍රතිශතය 14.8% කි.

මේ අතර ඉහළම තීරණ ගන්නා මට්ටම්වල කාන්තාවන් තීරණ ගන්නා ප්‍රතිශතය සීමිතය. එය දළ වශයෙන් 20% ක් ලෙස ගණනය කර ඇත. සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල තීරණ ගන්නා මට්ටමේ සිටින කාන්තා සංඛ්‍යාව එම සංඛ්‍යාවට ද වඩා අඩුය. කාන්තාවන්ගේ අත්දැකීම්, හැකියාවන්, සාරධර්ම රටේ ප්‍රතිපත්ති සම්පාදනයේ දී දායක කර ගත යුතු වේ. එසේ කිරීමෙන් පමණකි, අපට තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගත හැකි වනුයේ.




කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසන තුරන් කිරීමට අවශ්‍ය නිති සම්පාදනය කිරීම, අවිධිමත් අංශයේ රැකියා කරනු ලබන කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය ගණනය කිරීම, කාන්තා අයිතිවාසිකම් තහවුරු කෙරෙන අන්දමින් නීති සංශෝධනය කිරීම, විධිමත් අංශයේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය දැනට ඇති 35% සීමාවෙන් බැහැරව ඔවුන්ට විධිමත් අංශයට ඇතුළත් වීමට ඉඩකඩ සැලසීම අද දවසේ රටේ සංවර්ධනය ගැන කථා කරන අප ප්‍රධාන වශයෙන්ම සිදුකළ යුතු කාර්යයන් වන්නේ ය.



2022.06.06 දින පිළිගත් දේශපාලන පක්ෂ සමඟ පවත්වන ලද විශේෂ සාකච්ඡාව.



මැතිවරණ කොමිෂන් සභාව UN Women නියෝජිතයන් සමඟ පැවත්වන ලද විශේෂ සාකච්ඡාව.



2022.06.09 දින මැතිවරණ කොමිෂන් සභාවේ සමාජිකයින් හා ආගමික නායකයින් අතර පවත්වන ලද විශේෂ සාකච්ඡාව.



2022.07.22 හා 2022.07.29 දෙදින පැෆ්රල් සංවිධානය විසින් සංවිධානය කළ කාන්තා සිවිල් ක්‍රියාකාරිනියන් දැනුම්වත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්වූ "වෙනසකට මඟක්" වැඩමුළුව.



මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධව සියළුම මාණ්ඩලික නිලධාරීන් සඳහා 2022.06.26 දින සිට 2022.06.29 දක්වා නුවරඑළියේ දී පැවැත්වූ පුහුණු වැඩමුළුව.



2022.08.08 දින පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ පවත්වන ලද විශේෂ සාකච්ඡාව.



මැතිවරණ ආරවුල් කළමණාකරණය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම පිළිබඳව 2022.07.12 හා 2022.07.20 දෙදින පවත්වන ලද් මූලික සාකච්ඡාව.



මැතිවරණ නීති සංශෝධන සමාජගත කිරීම පිළිබඳව ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළු.


**උපදේශක මණ්ඩලය**

නීතිඥ නිමල් ජී. පුංචිහේවා - සභාපති
එස්. බී. දිවාරත්න - සාමාජික
කේ.පී.පී. පතිරණ - සාමාජික
එම්.එම් මොහමඩ් - සාමාජික
පී.එස්.එම්.චාල්ස් - සාමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
**සංස්කාරක** - චන්න පී. ද සිල්වා (අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
**පරිගණක පිටු සැකසුම** - අමිල ගමගේ
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - නීති, විමර්ශන හා සැලසුම් ශාඛාව
මැතිවරණ කොමිෂන් සභාව



**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**

සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl
Election Commission of Sri Lanka



ISSN-2706-0047